සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 8 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තු ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

**සැලකිය යුතුයි:**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න
- පහත සඳහන් ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) මුළු මැවිල්ලේම අයිතිකරු වන්නේ,
(1) දෙවියන් වහන්සේ (2) ජේසුස් වහන්සේ
(3) ශුද්ධාත්මයාණන් (4) මිනිසා

(02) ඊශ්‍රායල්වරු වහලුන් ලෙස සිටි අවුරුදු ගණන වන්නේ,
(1) 400 (2) 350 (3) 430 (4) 500

(03) ගලීල මුහුදට යොදන තවත් නමකි,
(1) රතු මුහුද (2) ගෙනසෙරෙත් විල
(3) ඉන්දියන් සාගරය (4) පැසිපික් සාගරය

(04) අල්පේවුස්ගේ පුත් ලෙස හඳුන්වන්නේ,
(1) පේදුරු (2) ජාකොබ් (3) ඇන්ඩෘ (4) පිලිප්

(05) 'යාච්ඤාවේ ගුරුවරිය' ලෙස හඳුන්වන්නේ,
(1) එලීසා ඇග්නිව් (2) ජොයිස් ද සිල්වා
(3) තෙරේසා මව්තුමිය (4) මාර්තා

(06) 'නබි' ලෙස හඳුන්වන්නේ,
(1) පූජකවරු (2) රජවරු (3) ස්නාවක ජොහාන් (4) දිවැසිවරු

(07) විනිශ්චකාරවරියක් හා දිවැසිවරියක් ලෙස පරණ ගිවිසුමේ සඳහන් වන කාන්තාව වන්නේ,
(1) එස්තර් (2) නයෝමි (3) දෙබෝරා (4) රූත්

(08) පැරණි ගිවිසුමේ පොත් ගණන,
(1) 39යි (2) 27 යි (3) 7 යි (4) 66යි

Department of Education - Western Province

(09) ''ඔබ කැමැති සේක් නම්, මා පවිත්‍ර කිරීමට පුළුවන්නැයි'' මෙම ප්‍රකාශය තුළ ගැබ්ව ඇති කරුණක් වන්නේ,

(1) සුව වීමට දේව කැමැත්ත අවශ්‍ය බව
(2) ජේසුස් වහන්සේ ගැන තිබූ ගැඹුරු විශ්වාසය හා ඇදහිල්ල
(3) ජේසුස් වහන්සේගේ බලය සැක කිරීම
(4) පවිත්‍ර කිරීමේ බලය ඇත්තේ ජේසුස් වහන්සේට පමණයි

(10) 'ආබ්‍රහම්ගේ පුත්‍රයා' ලෙස ජේසුස් වහන්සේම හැඳින්වූයේ,

(1) ලාසරස් (2) ජායිරස් (3) සාකේවුස් (4) පේදුරු

(11) 'පාදවල දූවිලි ගසා දැමීම' තුළින් සංකේතවත් වනුයේ,

(1) පවිත්‍ර වීම (2) දේව විනිශ්චය (3) කෝපය (4) ධර්මදූත සේවය

(12) ඊශ්‍රායල් ජනතාව විප්‍රවාස ගත වූයේ,

(1) ක්‍රි.පූ. 500 (2) ක්‍රි.පූ.325 (3) ක්‍රි.පූ. 430 (4) ක්‍රි.පූ. 587

(13) ජෙරමියා යන නමෙහි අර්ථය වන්නේ,

(1) දෙවියන් වහන්සේගේ දායාදය (2) දෙවියන් වහන්සේ විසින් ඔසවාගනු ලැබීම
(3) වතුරෙන් ගොඩගත් (4) ජාතීන්ගේ පියා

(14) විප්‍රවාසයෙන් පසු නැවත දේවමාළිගාව ගොඩනැගීමට දායක වූයේ,

(1) ආමෝස (2) දාවිත් (3) එස්රා (4) යෙසායා

(15) ආදී පීතෘ යුගය ලෙස හඳුන්වන කාල වකවානුව වන්නේ,

(1) ක්‍රි.පූ.2000 - 1700 (2) ක්‍රි.පූ.950 - 100
(3) ක්‍රි.පූ.2000 - 1000 (4) ක්‍රි.පූ.2000 - 950

(16) ආබ්‍රහම්ගේ පියා වූයේ,

(1) ජෙස්සේ (2) ලොත් (3) ජාකොබ් (4) තේරා

(17) දස පනතේ පස්වන පනත තුළින් ඉගෙනගත හැකි දෙයකි,

(1) ඉරුදින නොකඩවා නමස්කාර කිරීම
(2) දෙමාපියන් ගෞරව කිරීම
(3) වාද විවාද කරමින්, නොගැළපෙන වචන කතා කරමින් මව්පියන් අවතක්සේරු නොකිරීම
(4) එකිනෙකාගේ ජීවිත වලට ගරු කිරීම

(18) පංච පුස්තකය ලියවුනේ,

(1) දේවානුභාවය තුළින් (2) දෙවියන් වහන්සේ තුළින්
(3) මිනිසා තුළින් (4) ජේසුස් වහන්සේ තුළින්

Department of Education – Western Province

(19) ගොවිජනතාව සඳහා අනන්‍යතාවයක් ඇතිකර දීමට උත්සහ කළේ,

(1) ඩෙස්මන් ටුටු පියතුමා (2) ගරු මයිකල් රොද්‍රිගෝ පියතුමා

(3) සේවක සැමුවෙල් සෙල්වරත්නම් පියතුමා (4) ජුසේවාස් පියතුමා

(20) 'ටෝරාම' යනුවෙන් හඳුන්වන්නේ,

(1) බයිබලය (2) පංච පුස්තකය

(3) පරණ ගිවිසුම (4) ද්වීතීය සම්මත ග්‍රන්ථය

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

(01) කෙටි පිළිතුරු සපයන්න.

(1) ශුද්ධාත්මක ඵල 2ක් නම් කරන්න.

(2) ආදි පීතෘ වරු දෙදෙනෙක් නම් කරන්න.

(3) පහත දී ඇති වචන වලින් සංකේතවත් කරන්නේ කුමක් ද?

(1) හොඳ නරක අවබෝධකර ගැනීමේ ගස

(2) සර්පයා

(4) ජේසුස් වහන්සේ විසින් පේදුරුට පැවරූ වගකීම් 2 ක් ලියන්න.

(5) ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් අපට ලැබෙන දීමනා 2ක් ලියන්න.

(6) 'එප්පාතා' යන වචනයේ අර්ථය ලියන්න.

(7) ඊසාක්ගේ පුතුන් දෙදෙනා නම් කරන්න.

(8) කාන්තාර ගමන තුල ඊශ්‍රායල්වරු දෙවියන් වහන්සේ අත්දුටු අවස්ථාව් 03ක් සඳහන් කරන්න.

(9) ශුද්ධාත්මයාණන් තුල බලවත් මෙහෙවරක් කළ මෑත කාලයේ පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න.

(10) නිවස තුල ශුද්ධාත්මයාණන්ගේ ආලෝකය පෙන්විය හැකි ආකාර 2ක් ලියන්න.

(ලකුණු10 x2 = 20)

(02) (1) 'ආබ්‍රහම්' යන නමෙහි අර්ථය ලියන්න. (ලකුණු02)

(2) දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දු 3ක් සඳහන් කරන්න. (ලකුණු03)

(3) ආබ්‍රහම්ගේ කැඳවීම තුළ දක්නට ලැබෙන ඔබේ ජීවිතයට ගතහැකි අභියෝග 5ක් ලියා එය ඔබේ ජීවිතයට අදාල කරගන්නේ කෙසේදැයි ලියා දක්වන්න. (ලකුණු05)

(03) (1) පංච පුස්තකයට ඇතුළත්වන ග්‍රන්ථ 02ක් ලියන්න. (ලකුණු02)

(2) දස පණතට අදාල වන පනත් 3ක් ලියන්න. (ලකුණු03)

(3) ඔබ සඳහන් කළ පනත් අතරින් එක් පනතක් තෝරා එය ඔබේ ජීවිතයට ඇතුලත් වන්නේ කෙසේදැයි පහදන්න. (ලකුණු05)

(04) ''වෙහෙස වන්නාවූ බර උසුලන්නා වූ සියල්ලනී, මා වෙත එන්න මම ඔබට සහනය දෙන්නෙමි''

(1) මෙසේ ජේසුස් වහන්සේ සහනය දුන් පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු02)

(2) අද සමාජයේ කොන්වූ පිරිස කවරේද? (ලකුණු03)

Department of Education – Western Province

(3) කිතුණු දරුවන් ලෙස මෙම ජනතාව වෙනුවෙන් කල හැකි දේ පහදමින් මිතුරෙකුට ලිපියක් ලියන්න. (ලකුණු05)

(05) ''රෝගින්ට මිස නිරෝගීන්ට වෙදාගෙන් කම් නැත''

(1) මෙහි අවස්ථා සම්බන්ධය ලියන්න. (ලකුණු02)

(2) ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් කැඳවීමේදී තිබූ විශේෂ ලක්ෂණ 3ක් ලියන්න. (ලකුණු03)

(3) දේව කැඳවීම ලද ඔබ එය ක්‍රියාත්මක කරා අයුරු විස්තර කරන්න. (ලකුණු05)

(06) (1) එදා අද සමාජයේ කාන්තාවන් ලක්වූ අසාධාරණයන් 2ක් ලියන්න. (ලකුණු02)

(2) ජේසුස් වහන්සේ කාන්තාවන්ට නව අනන්‍යතාවයක් දුන් අවස්ථා 3ක් ලියන්න. (ලකුණු03)

(3) සභාවේ සහ සමාජය තුළ කාන්තාවන්ගේ දායකත්වය යන මාතෘකාව යටතේ කෙටි රචනයක් ලියන්න. (ලකුණු05)

(07) පහත සඳහන් පුද්ගලයන් දෙදෙනෙකු පිළිබඳ කෙටිසටහන් ලියන්න.

(1) දෙබෝරා

(2) ඊසාක්

(3) නෙහෙමියා

(4) ජෙරමියා (ලකුණු2 X5 = 10)

Department of Education – Western Province